)විශ්ම ඇවිලු!දි ටිචිරිම්වි
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

11 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 03 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- අංක 01 40 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පහත දැක්වෙන කවි / සංවාද ඇසුරෙන් අංක 01 06 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A රුසිරෙන් අඟනක් මනා ලොව නෑ ඉතින් තව සරිලනා
මේ ලෙසින් සිතමින් වෙනා බල ලොංචිනා එන සෝබනා

B රුදුරු මරු යකා මුගුරක් ගෙන අතට
විදුරු තරු දෙකා මෙන් නෙත් රුවිය මට
ඇදුරු මට දකානර බිල්ලා ගන්නට
පැදුරු පිට තැබුවා යකුට කන්නට

C දේසේ සිට ආ ඒ ගුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් එල්ලා
තඹරාවිට වෙද රාළගේ බල්ලා
කාපිලු ගුරුවගෙ කකුලම අල්ලා

D ගුමු නාදේ දෙන බඹරගෙ දොසිනා කරදර විය බොහො සේ
ඒ මල දාලා ආවේ ගුම් ගාලා මාගේ මූණ රිද්දා
වත මාගේ මල වාගේ එයි හක්ෂගේ එයි රිංගේ
මම කාට කියම්දෝ කරදර මේවා මාගේ මූණ රිද්දා

E ඉර පායන කල මොණරිඳු දෙදෙනෙක් ඉරට නැමී වඳිතෙයි
මොණරිත්, මොණරත් පිල් විදහාගෙන සූරිය රැකඳ ගතෙයි

01 පහතරට ගැමි නාටකයක් නියෝජනය කරන පද්‍යය වනුයේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

02 B අක්ෂරයෙන් දැක්වෙන ශාන්තිකර්මය වනුයේ,
(1) සූනියම් යාගය (2) රටයකුම (3) සන්නියකුම (4) ගම්මඩු

03 උඩරට පළාතට අයත් ජන නාටකයක් දැක්වෙන අක්ෂරය වනුයේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

04 C අක්ෂරයෙන් දැක්වෙන ජන නාටකය
(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) නූර්ති

05 නාඩගම්වලට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

06 සවුදම් ආශ්‍රයෙන් කරන ගීත කාණ්ඩය අයත් වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

07 නාට්‍යයක ප්‍රධාන අරමුණ වන්නේ,
(1) උපදේශනයයි. (2) රසයයි. (3) කථාවයි. (4) රූපයයි.

08 නාට්‍ය පෙළක් ප්‍රබලවීමට අවශ්‍ය වන්නේ,
(1) ගැටුම් අවස්ථාය (2) අනුශාංගික ශිල්පය
(3) නාට්‍ය ගීතය (4) රංග විධානවලින් යුක්ත පෙළය

09 ප්‍රාසාංගික කලා පමණක් අයත් වරණය
(1) නර්තනය, චිත්‍ර, මුද්‍රා, නාට්‍යය (2) නාට්‍යය, මුද්‍රා, නර්තනය, සංගීතය
(3) චිත්‍ර, රූපවාහිනී, නර්තනය, නාට්‍යය (4) ගීත, චිත්‍ර, මුද්‍රා, නර්තනය

10 නාට්‍යයක් යනු,
(1) තනි පුද්ගලයෙකුගේ දායකත්වයෙන් ඉටුකරයි.
(2) කාලීන තේමා යොදාගනියි.
(3) ජීවිතය අනුකරණය කරයි.
(4) ප්‍රේක්ෂක දායකත්වය අවශ්‍ය නොවෙයි.

11 වර්තමානයේ ශ්‍රී ලංකාවේ දමිළ නාට්‍යය හා සම්බන්ධ මහාචාර්යවරුන් අතරට අයත්වන්නේ,
(1) එස්. කනපතිපිල්ලෙයි හා සුන්දරලිංගම්
(2) එස්. මෞනගුරු හා එස්. විද්‍යානන්දන්
(3) කේ. ශිවතම්බි හා චෞර්ණලිංගම්
(4) චෞර්ණලිංගම් හා කමලදාස්

12 ප්‍රාසාංගික කලාවක් වන රූකඩ නාට්‍යයේ රූකඩ නටවන ශිල්පියා
(1) පොතේගුරු නම් වේ. (2) සූත්‍රධාර නම් වේ.
(3) කාරියකරවන රාළ නම් වේ. (4) කට්ටියකාරන් නම් වේ.

13 බැලේ නාට්‍යය කලාවේ කැපීපෙනෙන ලක්ෂණය වන්නේ,
(1) ගායනයයි. (2) නර්තනයයි. (3) රූපණයයි. (4) මුද්‍රාවයි.

14 වේදිකා නාට්‍යයක විචිත්‍රවත් ප්‍රේක්ෂාවක් ඇතිකිරීමේ වගකීම භාරවන්නේ,
(1) වේදිකා පාලකට ය. (2) අධ්‍යක්ෂකවරයාට ය.
(3) රූපණ ශිල්පීන්ට ය. (4) පසුතල නිර්මාණයන්ට ය.

● අංක 15 සිට 19 දක්වා වූ ප්‍රශ්නවලට පහත වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තන/අනුවර්තන | මෙරට නිෂ්පාදනය |
|---|---|---|---|
| ද පබ්ලික් එනිමි | හෙන්රික් ඉබ්සන් | අ ................................ | සුනන්ද මහේන්ද්‍ර |
| ආ ................................ | සොෆොක්ලීස් | ඇන්ටිගනී | ආරියවංශ රණවීර |
| ද ප්‍රොපෝසල් | ඇ ................................ | හරිම බඩු හයක් | සුගතපාල ද සිල්වා |
| ඈ ................................ | ගාර්ෂියා ලෝර්කා | මූදු පුත්තු | ඉ ................................ |
| රන් ෆෝ යුවර් වයිෆ් | රේ කැනී | ඊ ................................ | බන්ධුල විතානගේ |

15 ''අ'' අක්ෂරයට අයත් නාට්‍යයේ නම කුමක් ද?
(1) රූකඩ ගෙදර (2) ජනහතුරා (3) සයුරෙන් ආ ළඳ (4) වෙරි වත්ත

16 ''ආ'' කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක් ද?
(1) ඇන්ටිගනී (2) ඊඩිපස් රජ
(3) ප්‍රොමිතියස් බන්ධනය (4) ඊඩිපස් රෙක්ස්

17 ''ඇ'' කොටුවට අයත් නාට්‍යයේ නම කුමක් ද?
(1) ගාර්ෂියා ලෝර්කා (2) ඇන්ටන් චෙකොෆ්
(3) ටෙනසි විලියම් (4) සොෆොක්ලීස්

18 ''ඈ'' කොටුවට අයත් නාට්‍යයේ නම කුමක් ද?
(1) ඇපල් කාර්ට් (2) ද මැරේජ් (3) යෙර්මා (4) ද චෙරි ඕර්චාඩ්

19 ''ඊ'' කොටුවට අයත් නාට්‍යයේ නම කුමක් ද?
(1) බෙරහඬ (2) මූදු පුත්තු (3) වෙස්මුහුණු (4) රෝමය ගිනිගනී

20 නිශ්චිත පෙළක් සහිත නාට්‍ය සම්ප්‍රදාය වනුයේ,
(1) සොකරි නාට්‍යයයි. (2) නාඩගම්මය
(3) කෝලම්මය (4) නාට්‍යමය පෙළපාලිය

21 ''කාමන් කුත්තු'' නම් සම්ප්‍රදාය ප්‍රචලිතව පවතින්නේ,
(1) උඩරට වතුකරයේ ය. (2) යාපනයේ ය.
(3) වන්නි ප්‍රදේශයේ ය. (4) මඩකලපුවේ ය.

22 ''මිනර්වා'' නාට්‍ය රචනා කොට නිෂ්පාදනය කරන ලද්දේ,
(1) සිරිසේන විමලවීර (2) බී. ඒ. ඩබ්. ජයමාන්න
(3) නීතිඥ ජෝන් ද සිල්වා (4) එදිරිවීර සරච්චන්ද්‍ර

23 ''රාවනේසන්'' නම් දමිළ නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
(1) මහාචාර්ය මෞනගුරු (2) මහාචාර්ය විද්‍යානන්දන්
(3) මහාචාර්ය ශිවතම්බි (4) චෞර්ණලිංගම්

24 දේවදූතයෙකු ලෙස අබරණින් සරසා පිරිමි දරුවෙකු ඉදිරිපත් කරන පූජා කර්මය කුමක් ද?
(1) ආලවක දමනය (2) දොරකඩ අස්න
(3) සූවිසි විවරණ (4) මිලින්ද ප්‍රශ්නය

25 අඹ විදමන, මරා ඉපැද්දවීම, රාම මැරීම ආදී නාට්‍යමය අවස්ථා දක්නට ලැබෙන්නේ,
(1) සොකරි නාට්‍යයේ ය. (2) කෝලම් නාට්‍යයේ ය.
(3) කොහොඹා කංකාරියේ ය. (4) ගම්මඩුවලය.

26 ''ස්ට්‍රිප් ලාම්පු'' මගින් වේදිකාවේ කවර කොටසක් ආලෝකමත් කරගත හැකිද?
(1) සයික්ලෝරාමාව සහ පසුතලය ආලෝකමත් කරගත හැකිය.
(2) මුළු වේදිකාවම විහිදී යන ලෙස යොදාගත හැකිය.
(3) එක් දිශාවක් පමණක් ආලෝකමත් කරගත හැකිය.
(4) අත්භූතජනක සිදුවීම් සඳහා පමණක් යොදාගත හැකිය.

27 රුසියානු ජනප්‍රිය ''බැලේ'' නිර්මාණයකි
(1) Sleeping Beauty (2) Swan Lake
(3) Nut Cracker (4) Agnie

28 රංග වින්‍යාසය (choreography) යන්නෙහි අරුත වන්නේ,
(1) කථා වින්‍යාසය පෙළගැස්මයි.
(2) සිද්ධි පෙළගැස්මයි.
(3) වේදිකාවේ හැඩතල, නර්තනය නිර්මාණයයි.
(4) මුල, මැද, අග ගැළපීමේ පිළිවෙලයි.

29 ප්‍රථම සිංහල චිත්‍රපටය තිරගත වූ වර්ෂය වන්නේ,
(1) 1956 දී ය. (2) 1963 දී ය. (3) 1947 දී ය. (4) 1990 දී ය.

30 ''තලමල පිපිලා'' නාට්‍යයේ සංගීතය නිර්මාණය කරන ලද්දේ,
(1) රෝහණ වීරසිංහ මහතා (2) ජයලත් මනෝරත්න මහතා
(3) නන්දා මාලනී මහත්මිය (4) සුනිල් එදිරිසිංහ මහතා

31 පසුකාලයේ චිත්‍රපට නිෂ්පාදනය සඳහා යොමු වූ නාට්‍යකරුවෙකි
(1) සුගතපාල ද සිල්වා (2) චාල්ස් ඩයස්
(3) බී. ඒ. ඩබ්. ජයමාන්න (4) සී. දොන් බස්තියන්

32 සදාකාලික මානුෂීය ගැටුම අලලා 1961 දී නිර්මාණය වූ නාට්‍යයකි
(1) මනමේ (2) සිංහබාහු (3) රත්තරං (4) කදාවළලු

33 සංගීතය අනවශ්‍ය නොවන්නේ පහත කවර නාට්‍ය සම්ප්‍රදායට ද?
(1) ඔපෙරා (2) ගීත (3) ස්වභාවික (4) මුද්‍රා

34 පහත නාට්‍ය අතුරෙන් සංස්කෘත නාට්‍ය අතරට වැටෙයි
(1) ඊඩිපස් රජ (2) ශකුන්තලා (3) ජූලියස් සීසර් (4) සුභ සහ යස

35 සංවාද භාෂාව වෙනත් භාෂාවකට හැරවීමෙන් කෙරෙන නාට්‍යය
(1) පරිවර්තන නාට්‍යය යි. (2) අනුහරුපී නාට්‍යය යි.
(3) ස්වතන්ත්‍ර නාට්‍යය යි. (4) අනුවර්තන නාට්‍යය යි.

36 රූකඩ නාට්‍යයක ප්‍රධාන පුද්ගලයා හඳුන්වන්නේ,
(1) දේවදූතයා ලෙසිනි. (2) හඬ දූතයා ලෙසිනි.
(3) පොතේගුරා ලෙසිනි. (4) බහුභූතයා ලෙසිනි.

37 නූර්ති නාට්‍යය සඳහා භාවිතා වන සංගීතය
(1) හින්දුස්ථානි රාගධාරී සංගීතය (2) බටහිර සංගීතය
(3) කර්ණාටක සංගීතය (4) සරල ගී

38 රංගාලෝකයට ඇතුළත් ප්‍රධාන පහන් වර්ග දෙකකි
(1) යොමු පහන්, ස්ට්‍රිප් පහන් (2) යොමු පහන්, ධාරා පහන්
(3) ධාරා පහන්, වර්ණාලෝක චක්‍රය (4) යොමු පහන්, ආලෝක වැට

39 ඊඩිපස් රජ නාටකයේ රචකයා වන්නේ,
(1) ඇරිස්ටෝටල් (2) ඇරිස්ටොෆිනිස් (3) යූරිපිඩීස් (4) සොෆෝක්ලීස්

40 එම නාට්‍ය රචකයාගේ නාට්‍ය නිර්මාණයකි
(1) ඇන්ටිගනී (2) වළාකුළු (3) මධු පුදන්නෝ (4) ඩෝල්ස් හවුස්

(1 x 40 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(නුග ගසට ඉහළින් සඳ පායා ඇත. රංබරණා සහ හේතු ගෙයි ඉදිරිපස මිදුලේ වාඩි වී කථාබහේ යෙදී සිටිති.)

රංබරණා ආරා තල්ගස ගොන් වැඩුණා සේ
මෝරා තල්මල එන අන්දන්
පිරා වරලස අවුල් හරින සේ
තලමල සුළඟට යන අන්දන්

හේතු (එම කවිපදය යළි ගයමින්)
ලොකු අත්තේ, ලොකු අත්තා කොහොම ද ඔය තරම් ලස්සනට කවි සී පද වන්නං කියන්නට ඉගෙන ගත්තේ?

රංබරණා ලොකු අත්තගේ අප්පච්චිගෙන්

හේතු ඒ අප්පච්චි ඉගෙනගත්තේ?

රංබරණා ඒයාගෙත් අප්පච්චිගෙන්

හේතු කිරිමුත්තේ !

රංබරණා අන්න හරි, මුත්තගෙන් තමයි. අත්තා, මුත්තා, නත්තා, පනත්තා. කිත්තා, කිරිකිත්තගෙ ඉඳලා ඕවා කටින් කට ගෙනාපුවා

හේතු කිරිමුත්තා

රංබරණා නැටුං ශිල්පෙ විතරක් නෙවි කොල්ලො ජෝතිසේ, වෙදකම, බලි තොවිල්, කොහොඹා කංකාරි ..... ඔය ඕනෑ එහෙකට හපන්නු අපේ පරම්පරාව

(1) හේතු රංබරණාගේ කවුද? (ල. 01)
(2) රංබරණා ගායනා කරන කවිය කුමන වර්ගයේ කවියක් ද? (ල. 01)
(3) රංබරණා ප්‍රගුණ කර ඇත්තේ කවර ශිල්පය ද? (ල. 01)
(4) රංබණාගේ පරපුරේ ශිල්පය පැවතගෙන ආයේ කෙසේද? (ල. 01)
(5) ''අප්පච්චී'' යන්නට සමානාර්ථය දෙන පද 2 ක් ලියන්න. (ල. 01)
(6) මෙම නාට්‍යයට පසුබිම වන්නේ ශ්‍රී ලංකාවේ කවර ප්‍රදේශය ද? (ල. 01)
(7) රංබරණාගේ පරපුර ප්‍රධාන ශිල්පයට අමතරව ප්‍රවීණත්වයක් දැරූ වෙනත් ශිල්ප කවරේ ද? (ල. 01)
(8) මෙම සංවාදයෙහි සඳහන් ශාන්තිකර්මය කුමක් ද? (ල. 02)
(9) මෙම සංවාදයට අදාළ පසුතල නිර්මාණය කවරේ ද? (ල. 01)
(10) මෙම නාට්‍යය රචනා කරන ලද රචකයා කවුද? (ල. 02)

02 (1) උත්තර භාරතීය සංගීතය මූලික කොටගත් නාට්‍ය විශේෂය නම් කරන්න. (ල. 02)
(2) උක්ත නාටක විශේෂයේ ජනප්‍රිය රචකයින් දෙදෙනෙකු හා නිර්මාණ එක බැගින් සඳහන් කරන්න. (ල. 04)
(3) එම රංග ශෛලිය පිළිබඳව පැහැදිලි කරන්න. (ල. 06)

03 (1) ''අභිනය'' යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න. (ල. 02)
(2) සතර අභිනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)
(3) ''රූපණය'' අර්ථවත්වීම පිණිස සතර අභිනය උපයෝගී වන අයුරු පහදන්න. (ල. 06)

04 (1) පහතරට ප්‍රදේශයේ ප්‍රචලිත ශාන්තිකර්ම 2 ක් නම් කරන්න. (ල. 02)
(2) එයින් එක් ශාන්තිකර්මයක එන නාට්‍යමය අවස්ථාවක් නම් කරන්න. (ල. 04)
(3) එයින් එක් නාට්‍යමය අවස්ථාවක් පැහැදිලි කරන්න. (ල. 06)

05 (1) නෘත්ත යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ල. 03)
(2) නෘත්ත හා නෘත්‍යයේ සමාන අසමානතා ලියන්න. (ල. 03)
(3) නෘත්ත හා නෘත්‍යයෙන් නාට්‍යය වෙනස් වන්නේ කෙසේද? (ල. 06)

06 (1) අංග රචනා ශිල්පියා හැරුණුකොට වේදිකා නාට්‍යයකට දායකවන අනුශාංගික ශිල්පීන් 4 දෙනෙකු නම් කරන්න. (ල. 04)
(2) නාට්‍යයකට අංග රචනය සිදුකිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් දක්වන්න. (ල. 04)
(3) නාට්‍ය ශෛලීන් දෙකකට අදාළ වන ලෙස අංග රචනය සිදුකිරීමට අවස්ථාව සැලසුනිනම්, එහි දී ඔබ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ල. 04)

07 ආගමික කථා තේමාවක් රැගත් නාට්‍යෝචිත පෙළක් නිර්මාණය කරන්න. (ල. 12)